මගේ අංකය : TF
2026-09-01 දින.

<u>**අවසන් වසර නාට්‍ය නිෂ්පාදනයේ (සිහින රැඟුම) නාට්‍ය අධ්‍යක්ෂණය සඳහා අධ්‍යක්ෂවරයෙකු පත්කර ගැනීම**</u>

ටවර් නාට්‍ය හා රංගකලා පාසල අධ්‍යන වර්ෂ 2022/23 කණ්ඩායම විසින් නිර්මාණය කරන සිහින රැඟුම නාට්‍යය අධ්‍යක්ෂණය සඳහා සුදුසු අධ්‍යක්ෂවරයෙකු පත්කර ගත යුතුව ඇති බැවින් ඒ සඳහා මිල ගණන් කැඳවීමට පාලනාධිකාරිය තීරණය කර ඇත.

ඒ අනුව ඇමුණුමේ සඳහන් සුදුසුකම් හා කොන්දේසි වලට අනුව මෙම නාට්‍ය අධ්‍යක්ෂණය කිරීම සඳහා මුද්‍රාතබන ලද මිළ ගණන් 2026.09.14 දින පෙ.ව.11.00 ට පෙර**"සභාපති ,ප්‍රසම්පාදන කමිටුව,ටවර් හෝල් රඟහල පදනම, සවිසිරිපාය, අංක 123, විජේරාම මාවත, කොළඹ -07 "** යන ලිපිනයේ පිහිටි ටවර් හෝල් රඟහල පදනම ප්‍රධාන කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් බහාලනයට අතින් ගෙනැවිත් හෝ එදින පෙ.ව.11.00 ට පෙර ලැබෙන සේ උක්ත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. ප්‍රමාද වී ලැබෙන මිළ ගණන් ප්‍රතික්ෂේප කරනු ලබන අතර ලංසු විවෘත කරන අවස්ථාව සඳහා ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් අයෙකුට සහභාගී විය හැකිය.

මිළ ගණන් බහාලන කවරයේ ඉහළ වම් කෙලවරේ **" නාට්‍ය අධ්‍යක්ෂණය සඳහා අධ්‍යක්ෂවරයෙකු පත්කර ගැනීම සඳහා මිළ ගණන් "** ලෙස සඳහන් කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

**නිපුණ දිසානායක**
අධ්‍යක්ෂ(පාලන හා සංවර්ධන)
**දු.ක. : 0112682324**
**ෆැක්ස් අංකය : 0112678517**
**විද්‍යුත් තැපැල :** towersl@sltnet.lk

**අවසන් වසර නාට්‍ය නිෂ්පාදනයේ (සිහින රඟුම) නාට්‍ය අධ්‍යක්ෂණය සඳහා අධ්‍යක්ෂ වරයෙකු පත්තර ගැනීම**

**කොන්දේසි**

01 නාට්‍ය අධ්‍යක්ෂණය, රංග වින්‍යාසය සඳහා ජාතික මට්ටමින් ඇගයීම් ලබා තිබීම.

02 නාට්‍ය හා රංගකලාව පිළිබඳ විශ්වවිද්‍යාල මට්ටමින් පර්යේෂණ සිදුකර තිබීම.

03 පරිවර්තන හා අනුවර්තන නාට්‍ය අධ්‍යක්ෂණය පිළිබඳ අවම වශයෙන් වසර 10 ක ප්‍රවීනතාවයක් තිබීම.

04 නාට්‍ය හා රංගකලාව පිළිබඳ වැඩමුළු උපදේශකයෙකු ලෙස කටයුතු කර තිබීම.

05 ටවර් නාට්‍ය පාසලේ හෝ වෙනත් නාට්‍ය පාසලක හෝ විශ්වවිද්‍යාලයක නාට්‍ය අධ්‍යක්ෂණය පිළිබඳ අවම වශයෙන් වසර 15 ක් ඉගැන්වීම් කටයුතුවල නිරතවී තිබීම.

06. අධ්‍යක්ෂවරයා පුහුණුවීම් කාලයේ සිට නාට්‍ය වේදිකාගත කරන දිනය දක්වා කාලය තුළ තම සේවය ලබාදිය යුතුය. ඉදිරි වසර දෙකක කාලයක් නාට්‍ය නිර්මාණය පවත්වා ගැනිම සඳහා සුදුසු ක්‍රමවේදයක් යටතේ නාට්‍ය ප්‍රදර්ශනවලට අධ්‍යක්ෂවරයාගේ සේවය ලබාදිය යුතුය.